# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,275 - 2022 අප්‍රේල් මස 08 වැනි සිකුරාදා - 2022.04.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 684 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 686 |
| තොටුපළ රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 691 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 694 |


**සැ.යු.-** (i) ශ්‍රී ලංකා ගොඩනැගිලි සේවා ඉංජිනේරු සහ තාක්ෂණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2022 මාර්තු මස 25 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2022 අප්‍රේල් මස 29 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 අප්‍රේල් මස 12 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

ලංසු සඳහා ආරාධනයයි

**පහළ දිස්ත්‍රික්කයේ මුහුදුබඩ මාර්ගයේ බේරුවල හා අලුත්ගම අතර 36M47C හි ගර්හිත පාලම් සුන්බුන් ඉවත්කරලීම**

**SRS/F.7801**

ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුවේ සභාපති විසින්, පහළ දිස්ත්‍රික්කයේ මුහුදු බඩ මාර්ගයේ බේරුවල හා අලුත්ගම අතර 36M 47C හි ගර්හිත පාලම් සුන්බුන් (ආසන්න වශයෙන්) මෙට්‍රික් ටොන් 50 ක් ඉවත්කරලීම සඳහා මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

02. ලංසු භාරගැනීම 2022.04.20 දින ප. ව. 2.00 ට අවසන් කෙරේ.

03. දුම්රිය සේවයේ ප්‍රධාන මුල්‍ය නිලධාරි වෙත රු. 2,100 ක (රුපියල් දෙදහස් එක සියයක) ආපසු නොගෙවන මුදලක් ගෙවීමෙන් අනතුරුව, කොළඹ 10, ඕල්කොට් මාවත, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ප්‍රසම්පාදන) කාර්යාලයෙන් 2022.04.19 දින ප. ව. 3.00 තෙක් ලබාගත හැකි ආකෘති පත්‍ර මගින් පමණක් ලංසු ඉදිරිපත් කළ යුතු ය.

04. ලංසු භාරගැනීම අවසන් වූ වහාම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ප්‍රසම්පාදන) කාර්යාලයේ දී ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට එම අවස්ථාවට සහභාගීවන මෙන් ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍රා තැබූ ලංසු පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් ගෙනැවිත් භාරදිය යුතු ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ප්‍රසම්පාදන) කාර්යාලය,
ඕල්කොට් මාවත, කොළඹ 10.

06. ලංසුකරණ ලිපිලේඛන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ප්‍රසම්පාදන) කාර්යාලයේ දී ගාස්තු ගෙවීමකින් තොරව පරීක්ෂා කර බැලිය හැකි ය.

07. වැඩිමනත් විස්තර සඳහා ශ්‍රී ලංකා දුම්රිය සේවයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ප්‍රසම්පාදන) අමතන්න.

| | | |
|---|---|---|
| දුරකථන අංක | : | 94 (11) 2438078/94(11)2436818 |
| ෆැක්ස් අංකය | : | 94 (11) 2432044 |
| ඊමේල් | : | tender2@railway.gov.lk |
| වෙබ් අඩවිය | : | www.railway.gov.lk |

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය :SRS/F.7801

04-112

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

ලංසු සඳහා ආරාධනයයි

**ගර්හිත එංජින් හා රේල්බස් ඉවත් කරලීම**

කොන්ත්‍රාත් අංකය : SRS/F.7721

01. කොළඹ 10, ඕල්කොට් මාවත, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ගර්හිත එන්ජින් හා රේල්බස් ඉවත් කරලීම සඳහා ජාතික තරගකාරි ලංසුකරණ ක්‍රියාපටිපාටිය මගින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

02. ලංසු භාරගැනීම 2022.04.22 දින ප.ව . 2.00 ට අවසන් කෙරේ.

03. රු. 5,000.00 (රුපියල් පන්දහසක) ආපසු නොගෙවන ලිපිලේඛන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2022.04.21 දින ප. ව. 3.000 තෙක් ලබාගත හැකි ආකෘති පත්‍ර මගින් පමණක් ලංසු ඉදිරිපත් කළ යුතු ය.

04. ලංසුකරණ ලිපිලේඛන වල සඳහන් පරිදි රු. 3,25,000.00 ක (රුපියල් තුන්ලක්ෂ විසිපන් දහසක) වටිනාකමැති ලංසු සුරක්ෂණයක් සමග ඉදිරිපත් කළ යුතු ය.

05. ලංසු භාරගැනීම අවසන් වූ වහාම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ප්‍රසම්පාදන) කාර්යාලයේ දී ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට එම අවස්ථාවට සහභාගි වන මෙන් ඉල්ලා සිටිනු ලැබේ.

06. මුද්‍රා තැබූ ලංසු පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් ගෙනැවිත් භාරදිය යුතු ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ප්‍රසම්පාදන) කාර්යාලය,
ඕල්කොට් මාවත, කොළඹ 10.

06. ලංසුකරණ ලිපිලේඛන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ප්‍රසම්පාදන) කාර්යාලයේ දී ගාස්තු ගෙවීමකින් තොරව පරීක්ෂා කර බැලිය හැකි ය.

07. වැඩිමනත් විස්තර සඳහා ශ්‍රී ලංකා දුම්රිය සේවයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ප්‍රසම්පාදන) අමතන්න.

| | | |
|---|---|---|
| දුරකථන අංක | : | 94 (11) 2438078/94(11)2436818 |
| ෆැක්ස් අංකය | : | 94 (11) 2432044 |
| ඊමේල් | : | tender2@railway.gov.lk |
| වෙබ් අඩවිය | : | www.railway.gov.lk |

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F.7721

04-152

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

ලංසු සඳහා ආරාධනයයි

**කොළඹ, රත්මලාන, දෙමටගොඩ, දුම්රිය අංගනයන්හි සහ විවෘත අංගනයන්හි ඇති ගර්හිත මගී මැදිරි හා වැගන් (භාණ්ඩ ප්‍රවාහන මැදිරි) ඉවත් කරලීම**

කොන්ත්‍රාත් අංකය : SRS/F.7815

කොළඹ 10, ඕල්කොට් මාවත, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවයේ කොළඹ, රත්මලාන, දෙමටගොඩ දුම්රිය අංගනයන්හි සහ විවෘත අංගනයන්හි ඇති ගර්හිත මගී මැදිරි හා වැගන් (භාණ්ඩ ප්‍රවාහන මැදිරි) ඉවත් කරලීම සඳහා ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය මගින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

02. ලංසු භාරගැනීම 2022.04.21 දින ප.ව . 2.00 ට අවසන් කෙරේ.

03. රු. 12,000.00 (රුපියල් දෙළොස්දහසක) ආපසු නොගෙවන ලිපිලේඛන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2022.04.20 දින ප. ව. 3.000 තෙක් ලබාගත හැකි ආකෘති පත්‍ර මගින් පමණක් ලංසු ඉදිරිපත් කළ යුතු ය.

04. ලංසු, ලංසුකරණ ලිපිලේඛනවල සඳහන් පරිදි රු. 4,00,000.00 ක (රුපියල් හාර ලක්ෂයක) වටිනාකමැති ලංසු සුරක්ෂණයක් සමග ඉදිරිපත් කළ යුතු ය.

05. ලංසු භාරගැනීම අවසන් වූ වහාම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ප්‍රසම්පාදන) කාර්යාලයේ දී ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට එම අවස්ථාවට සහභාගි වන මෙන් ඉල්ලා සිටිනු ලැබේ.

06. මුද්‍රා තැබූ ලංසු පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් ගෙනැවිත් භාරදිය යුතු ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ප්‍රසම්පාදන) කාර්යාලය,
ඕල්කොට් මාවත, කොළඹ 10.

07. ලංසුකරණ ලිපිලේඛන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ප්‍රසම්පාදන) කාර්යාලයේ දී ගාස්තු ගෙවීමකින් තොරව පරීක්ෂා කර බැලිය හැකි ය.

08. වැඩිමනත් විස්තර සඳහා ශ්‍රී ලංකා දුම්රිය සේවයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ප්‍රසම්පාදන) අමතන්න.

| | | |
|---|---|---|
| දුරකථන අංක | : | 94 (11) 2438078/94(11)2436818 |
| ෆැක්ස් අංකය | : | 094 (11) 2432044 |
| ඊමේල් | : | tender2@railway.gov.lk |
| වෙබ් අඩවිය | : | www.railway.gov.lk |

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

04-153

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

ප්‍රසම්පාදන දැන්වීමයි

ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත රේල් බෙන්ඩර්ස් - මිකැනිකල් (02 way) සහ පෝටබල් ස්ලීපර් ඩ්‍රිලින් යන්ත්‍ර (Rail Benders - Mechanical (02 Way) and Portable Sleeper Drilling Machines) ප්‍රසම්පාදනය

ප්‍රසම්පාදන අංකය : SRS/F.7795

ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත (Rail Benders - Mechanical (02 Way) ක් සහ Portable Sleeper Drilling Machines) 25ක් සැපයීම සඳහා විදේශීය නිෂ්පාදකයන්/සැපයුම්කරුවන් වෙතින් ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුවේ සභාපති විසින් ජාත්‍යන්තර තරගකාරී ලංසුකරණ පදනම මත මුද්‍රා, තැබූ ලංසු කැඳවනු ලැබේ. ලංසුකරුවන්ට තම ලංසු සෘජුව හෝ ඔවුන්ගේ බලයලත් හා ඇටර්නි බලපත්‍රයකින් බලය පැවරූ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි නියෝජිතයකු මගින් ඉදිරිපත් කළ හැකිය.

අයිතම දෙක වෙන් වෙන් ව ඇගැයීමට ලක් කොට ප්‍රදානය කළ යුතු ය.

| *අයිතම අංකය* | *විස්තර* | *ප්‍රමාණය* |
|---|---|---|
| 01. | Rail Benders - Mechanical (02 Way) | 50 |
| 02. | Portable Sleeper Drilling Machines | 25 |

02. ලංසු භාරගැනීම 2022.05.10 වැනිදා (ශ්‍රී ලංකා වේලාවෙන්) ප. ව. 2.00 ට අවසන් කෙරේ).

03. ශ්‍රී ලංකා රුපියල් අටදහසක (රු. 8,000) ක හෝ පහසුවෙන් මාරුකර ගත හැකි සමාන මුදල් වර්ගයකින් ආපසු නොගෙවන ලිපිලේඛන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2022.05.09 වැනි දින ශ්‍රී ලංකා වේලාවෙන්) ප. ව. 3.00 තෙක් ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවත, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ප්‍රසම්පාදන) කාර්යාලයෙන් හෝ විදේශයන්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලවලින් හෝ ලබාගත හැකි ආකෘති පත්‍ර මගින් පමණක් ලංසු ඉදිරිපත් කළ යුතු ය.

04. ලංසු භාරගැනීම අවසන් වූ වහාම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ප්‍රසම්පාදන) කාර්යාලයේ දී ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට එම අවස්ථාවට සහභාගි වන මෙන් ඉල්ලා සිටිනු ලැබේ.

05. ලංසුකරුවන් තම ලංසුවල කොටසක් හැටියට රු. 3,00,000 හෝ පහසුවෙන් මාරුකරගත හැකි සමාන මුදල් වර්ගයකින් ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතු ය.

06. මුද්‍රා තැබූ ලංසු පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් ගෙනැවිත් භාරදිය යුතු ය.

සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ප්‍රසම්පාදන) කාර්යාලය,
ඕල්කොට් මාවත, කොළඹ 10.

07. ලංසුකරණ ලිපිලේඛන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ප්‍රසම්පාදන) කාර්යාලයේ දී ගාස්තු ගෙවීමකින් තොරව පරීක්ෂා කර බැලිය හැකි ය. වැඩිමනත් විස්තර සඳහා ශ්‍රී ලංකා දුම්රිය සේවයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ප්‍රසම්පාදන) අමතන්න.

දුරකථන අංක : 94 (11) 2438078/94(11)2436818
ෆැක්ස් අංකය : 094 (11) 2432044
ඊමේල් : tender2@railway.gov.lk
වෙබ් අඩවිය : www.railway.gov.lk

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය :SRS/F.7801

04-180

---

# බඩු බාහිරාදිය විකිණීම්

**මහෙස්ත්‍රාත් අධිකරණය - ගලගෙදර**

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලදුව රාජසන්තක කරනු ලැබූ වාහන සහ භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම අධිකරණය වෙත ඉදිරිපත් කරන ලදුව රාජසන්තක කරනු ලැබූ පහත උපලේඛනයේ දක්වා ඇති වාහන හා භාණ්ඩ **2022.04.30 වැනි දින පෙ. ව. 10.00** ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය මත වෙන්දේසිය පැවැත්වෙන දින පෙ. ව. 8.30 සිට 9.30 දක්වා වෙන්දේසියේ විකිණීමට නියමිත වාහන සහ භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැක.

03. වෙන්දේසියෙන් මිලදී ගන්නා වාහන සහ භාණ්ඩ එම අවස්ථාවේ මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලුම ගෙවීම් මුදල් වලින් ගෙවිය යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

04. වාහන සහ භාණ්ඩ මිලදී ගන්නා සෑම අයෙකු ම තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර, මිලදී ගන්නා සියලුම වාහන හා භාණ්ඩ එදින ප. ව. 4.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගතයුතු ය.

05. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවේ අධිකරණයේ අභිමතය පරිදි එම වාහන සහ භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ බලය අධිකරණය සතු වේ.

06. වාහන සහ භාණ්ඩ මිලදී ගැනීමට පැමිණෙන සෑම අයෙකු ම නිසි සෞඛ්‍ය උපදෙස් අනුගමනය කළ යුතු ය.

කේ. ඒ. ආර්. නදිශානී,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය - ගලගෙදර.

2022 මාර්තු මස 25 වැනි දින,
ගලගෙදර මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**වාහන හා භාණ්ඩ පිළිබඳ විස්තරය**

| *නඩු අංකය* | *වාහන/භාණ්ඩ* |
|---|---|
| අංක රහිත | 203-6017 (ත්‍රීරෝද රථය අබලි ද්‍රව්‍ය ලෙස) |
| 41036/13 | 43 -9128 ලොරි රථය |
| 4525/21 | WV 3288 හොණ්ඩා හොනට් යතුරු පැදිය (අබලි ද්‍රව්‍ය ලෙස) |
| 5248/19 | BCD 6932 යතුරු පැදිය |
| 4932/19 | 227-6078 බූම්ට්‍රක් රථය (අබලි ද්‍රව්‍ය ලෙස) |
| අංක රහිත | සවල් 05 |
| අංක රහිත | ත්‍රීවිල් හුඩ් ට්‍රැක් 01යි<br>හිස් වීදුරු බෝතල් තොගයක් |

04-121

---

**මහෙස්ත්‍රාත් අධිකරණය - හොරණ**

නඩු භාණ්ඩ වෙන්දේසිය

හොරණ මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් නොකියන ලද වෙන්දේසි කිරීමට නියම කර ඇති මෙහි පහත උපලේඛනයේ සඳහන් ද්‍රව්‍යයන් **2022.04.30 වැනි සෙනසුරාදා පෙ. ව. 10.00** ට හොරණ මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී විකුණනු ලැබේ.

ඉහත සඳහන් නඩු භාණ්ඩ අධිකරණ රෙජිස්ට්‍රාර්ගේ අවසරය ලබා වෙන්දේසි කිරීමට පැය භාගයකට පෙර ගැණුම්කරුවන්ට පරීක්ෂා කළ හැකි ය.

අධිකරණය විසින් නියම කරන ලද ලංසුව පිළිනොගැණෙන අවස්ථාවක දී අධිකරණයේ අවසරය පරිදි අදාළ භාණ්ඩය වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතු ය.

වෙන්දේසියේදී මිලට ගනු ලබන භාණ්ඩ සඳහා එවලේ ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර ගෙවීම් මුදල් මගින් පමණක් කළ යුතු ය.

මෙහි පහත උපලේඛනයේ සඳහන් කිසියම් භාණ්ඩයක් පිළිබඳව හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත

දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

භාණ්ඩ මිලදී ගනු ලබන අය විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
හොරණ.

**2022 ප්‍රසිද්ධ වෙන්දේසි භාණ්ඩ ලැයිස්තුව**

| | | | |
|---|---|---|---|
| 1. | අංක රහිත | | පැදුරු |
| 2. | අංක රහිත | | උදලු 10 |
| 3. | අංක රහිත | | සවල් 05 |
| 4. | 63863 | | දුඹුරු පැහැති ප්ලාස්ටික් බාල්දිය |
| 5. | 64059 | | ඇළුමිනියම් මුට්ටිය |
| 6. | 29507/17 | | විදුලි කියත |
| 7. | 64158 | | කලු පාට ලොකු ප්ලාස්ටික් බාල්දි 40 |
| 8. | අංක රහිත | | හිස් බෝතල් තොගයක් |
| 9. | අංක රහිත | | හිස් කෑන් තොගයක් |
| 10. | 50164 | (i) | ගෑස් සිලින්ඩරයක් |
| | | (ii) | රෙගියුලේටරය සහිත වට හතරේ ගෑස් ලිපක් |
| 11. | 61283 | (i) | වට තුන රෙගියුලේටරය සහිත ගෑස් ලිපක් |
| | | (ii) | ගෑස් සිලින්ඩරයක් |
| 12. | 51374 | (i) | වට හතරේ ගෑස් ලිපක් |
| | | (ii) | ගෑස් සිලින්ඩරයක් |
| 13. | 62998/21 | | වට හතර රෙගියුලේටරය සහිත ලිප |
| 14. | 62807 | | වට තුන රෙගියුලේටරය සහිත ගෑස් ලිපක් |
| 15. | 62906 | | වට හතරේ ලිපක් |
| 16. | 63851 | (i) | වට තුනේ රෙගියුලේටරය සහිත ගෑස් ලිප (ලිප කැඩී ඇත) |
| | | (ii) | ගෑස් සිලින්ඩරයක් |
| 17. | 64135 | | ගෑස් සිලින්ඩරයක් |
| 18. | 65861 | (i) | ගෑස් සිලින්ඩරයක් |
| | | (ii) | වට තුනේ රෙගියුලේටරය සහිත ලිපක් |
| 19. | 66301 | (i) | වට හතර රෙගියුලේටරය සහිත ලිපක් |
| | | (ii) | ගෑස් සිලින්ඩරයක් |
| 20. | 65796 | (i) | ගෑස් සිලින්ඩරයක් |
| | | (ii) | වට හතර රෙගියුලේටරය සමග ලිපක් |
| | | (iii) | කොළ පාට බේසමක් |
| 21. | 66218 | | ගල් ඉන්නක් |
| 22. | 60968 | | දෙකෙලවර අගුල් සහිත හම් පටි 02 |
| 23. | 66888 | | ගැරුම් වට්ටි 03 |
| 24. | 66889 | | ඉල්ලම් කුරු 01 |
| 25. | 65473 | | ගෑස් සිලින්ඩරය<br>වට හතර රෙගියුලේටරය සහිත ලිපක් |
| 26. | 65443 | | වට තුනේ ගෑස් ලිප් 02<br>වට හතරේ ගෑස් ලිප් 01<br>වතුර මෝටර් 01 |

04- 135

**දිසා මහෙස්ත්‍රාත් අධිකරණය - හලාවත**

**අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

මෙම අධිකරණයේ බී 1236/19 නඩුවට අදාළ තවදුරටත් රඳවා තබා ගැනීමට නොහැකි ටෝලර් යාත්‍රාව සහ ඊට අදාළ පහත සඳහන් භාණ්ඩ වර්ෂ **2022.04.22** වැනි දින ප. ව. **12.30** ට මෙම අධිකරණ භූමියේදී වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් වන කිසියම් භාණ්ඩයක් හෝ භාණ්ඩ සම්බන්ධයෙන් හිමිකම් කියන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වෙන දිනට පෙර හෝ වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ලිඛිතව අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබාගෙන වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ මහජනයාට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවන්හි දී හා අධිකරණයේ අභිමතය පරිදි වෙන්දේසියට ඉදිරිපත් කර ඇති ඕනෑම භාණ්ඩයක් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව ඇත.

05. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන යම් භාණ්ඩයක් වේ නම් එම අවස්ථාවේදී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලුම ගෙවීම් මුදලින් පමණක් කළ යුතු අතර, චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

06. වෙන්දේසියෙන් භාණ්ඩ මිලදී ගැනීමට පැමිණෙන ගැනුම්කරුවන් තම අනන්‍යතාවය තහවුරු කිරීමට ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

07. වෙන්දේසිය පිළිබඳ පැමිණිලි කිසිවක් වෙතොත් වෙන්දේසිය පවත්වන වේලාවේ දී ම එය ඉදිරිපත් කළ යුතු අතර වෙන්දේසියෙන් පසු ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

බී. ඒ. ඒ. අයි. බුද්ධදාස,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්.

2022 මාර්තු මස 28 වැනි දින,
හලාවත දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**ප්‍රසිද්ධ වෙන්දේසිය**

| *අනු. අංකය* | *නඩු අංකය* | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 01. | බී 1236/19 | අංක 1 - MUL - A - 0244 - GLE දරන ටෝලර් යාත්‍රාව |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| | | * අංක DEH - 4550 - UB දරන කැසට් යන්ත්‍රය |
| | | * HUNO - 32 - MODEL NUMBER 4436 - 0781 දරන GPS යන්ත්‍ර 01 |
| | | * ලොකු බැටරි කැලි 02 |
| | | * AA ප්‍රමාණයේ බැටරි කැලි 03 |
| | | * 02 kg කාබන්ඩයොක්සයිඩ් සිලින්ඩරය |
| | | * LED වර්ගයේ විදුලි ලාම්පු 02 |
| | | * I-COM-AT-130 වර්ගයේ ඇන්ටනා ටියුනර් 01 |
| | | * I-COM-IC-M710 වර්ගයේ රේඩියෝ යන්ත්‍රය හා එම යන්ත්‍රයේ රිසිවර් 01 |
| | | * MAGNETIC COMPASS 01 |
| | | * LUCAS වර්ගයේ බැටරි 03 |
| | | * PANASONIC වර්ගයේ බැටරි 01 |
| | | * දැල් ආම්පන්න |
| | | * මෝර දැල් කට්ටල 01 |
| | | * මසුන් මැරීමට යොදා ගන්නා පන්නාකටු 200ක් (දිරාපත් වී ඇත) |

04-129

---

**මහෙස්ත්‍රාත් අධිකරණය - අවිස්සාවේල්ල**

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබ හා හිමිකම් නොපාන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. අවිස්සාවේල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරනු ලැබූ හා හිමිකම් නොපාන ලද පහත සඳහන් භාණ්ඩ **2022.04.30 වැනි දින පෙ. ව. 10.00** ට මෙම අධිකරණ භූමියේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් භාණ්ඩ වලට හිමිකම් පාන්නකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර ස්වකීය හිමිකම් ලියවිල්ලක් මගින් අධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් විය යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය ඇතිව වෙන්දේසියට පැය භාගයකට පෙර විකිණීමට නියමිත භාණ්ඩ මහජනයාට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය මගින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍ය වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ දී මිලදී ගනු ලබන භාණ්ඩ සහ වාහන එවලේ ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලු ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත් භාරගනු නොලැබේ.

6. වෙන්දේසියට සහභාගි වන ගැණුම්කරුවන් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුණුම්පත ඉදිරිපත් කළ යුතු ය.

කේ. එම්. ජේ. පී. සමරසිංහ,
මහෙස්ත්‍රාත්,
අවිස්සාවේල්ල.

2022 මාර්තු මස 29 වැනි දින,
අවිස්සාවේල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමේ භාණ්ඩ ලැයිස්තුව**

වෙන්දේසි දිනය : 2022.04.30 පෙ. ව. 10.00

| අනු. අංකය | නඩු අංකය | විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | 59746 | ඇළුමිනියම් මුට්ටි | 01 |
| 02. | 55542 | ගෑස් ලිප් | 01 |
| | | ගෑස් සිලින්ඩර් | 01 |
| 03. | 64197 | උදළු | 01 |
| | | කුඩ | 01 |
| | | වට්ටි | 01 |
| 04. | 30706 | බාල්දි | 01 |
| 05. | 31894 | කුඩ | 01 |
| 06. | 5616 | බාල්දි | 01 |
| 07. | 49121 | රින්චි | 01 |
| | | බට | 01 |
| | | ඔක්සිජන් ටැංකි | 01 |
| | | ඔක්සිජන් බට | 01 |
| | | මවුත් | 01 |
| | | ගැරුම් වට්ටි | 01 |
| | | වයර් | 01 |
| | | බාල්දි | 01 |
| | | ඉල්ලම් කුරු | 01 |
| | | අලවංගු | 01 |
| 08. | 48907 | මෝටර් | 01 |
| | | වයර් කෝඩ් | 01 |
| 09. | 63880 | සවල් | 01 |
| | | බාල්දි | 01 |
| 10. | 64184 | උදළු | 01 |
| | | තාච්චි | 01 |
| 11. | 63476 | බාල්දි | 02 |
| | | සවල් | 01 |

| අනු. අංකය | නඩු අංකය | විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 12. | 64124 | කළුගල් ප්‍රතිමා | 01 |
| | | පිත්තල ලෝහ ප්‍රතිමා | 01 |
| 13. | 69968 | උදළු | 02 |
| | | කුඩ | 02 |
| 14. | 58378 | කුඩ | 01 |
| | | උදළු | 01 |
| 15. | 69744 | ගැරුම් වට්ටි | 01 |
| | | උදළු | 01 |
| 16. | 69360 | බාල්දි | 01 |
| 17. | 69651 | වට්ටි | 01 |
| 18. | 69665 | වට්ටි | 02 |
| | | බාල්දි | 01 |
| 19. | 69649 | කොරස් | 01 |
| 20. | 63547 | ගෑස් ලිප් | 01 |
| | | ගෑස් සිලින්ඩර් | 01 |
| 21. | 52194 | ගෑස් සිලින්ඩර් | 01 |
| | | ගෑස් ලිප් | 01 |
| 22. | AR 9335/20 | වතුර මෝටර් | 01 |
| | | වයර් රෝල් | 01 |
| 23. | 39824 | යකඩ ඉනි | 02 |
| | | බදාම තාච්චි | 01 |
| 24. | 65051 | ගෑස් සිලින්ඩර් | 02 |
| | | ගෑස් ලිප් | 01 |
| | | රෙගියුලේටර් සහිත බට | 01 |
| 25. | AR 9951/21 | බාල්දි | 01 |
| | | වට්ටි | 01 |
| | | ටියුබ් | 01 |
| | | උදළු | 01 |
| | | ඉල්ලම් කුරු | 01 |
| | | ජංගම දුරකතන | 03 |
| 26. | 71095 | පොරව | 01 |
| 27. | 71229 | ගැරුම් වට්ටි | 01 |
| 28. | 71228 | යකඩ බාල්දි | 01 |
| 29. | 70204 | ඉල්ලුම් කුරු | 01 |
| | | උදළු | 01 |
| 30. | 70627 | කුඩ | 01 |
| | | ටියුබ් | 01 |
| 31. | 70624 | ගැරුම් වට්ටි | 01 |
| 32. | 70917 | වේවැල් කුඩ | 01 |
| 33. | 70918 | ගැරුම් වට්ටි | 01 |
| 34. | 69673 | බාල්දි | 01 |
| 35. | 62190 | ගැරුම් වට්ටි | 01 |
| | | උදළු තල | 01 |
| | | ඔක්සිජන් පුරවන ටැංකි | 01 |
| | | රබර් බට | 01 |
| 36. | 70625 | සුළං පුරවන ලද ටියුබ් | 01 |
| | | බාල්දි | 01 |
| 37. | 68340 | සවල් | 01 |
| | | බාල්දි | 01 |
| 38. | 47082 | ගැරුම් වට්ටි | 01 |
| 39. | | වීදුරු බෝතල් තොගයක් | |
| 40. | | ප්ලාස්ටික් කෑන් තොගයක් | |
| 41. | | බැරල් | 54 |

**2020 වසරේ භාණ්ඩ සමීක්ෂණයෙන් වෙන්දේසිය සඳහා නියමිත භාණ්ඩ**

| | | |
|---|---|---|
| 42. | වානේ කැබිනට් ලාච්චු 04 | 02 |
| 43. | පරිගණක පුටු | 01 |
| 44. | ලිපිකරු මේස | 01 |
| 45. | වානේ මේස | 01 |

| අනු අංකය | නඩු අංකය | වාහන අංකය හා වාහනය | |
|---|---|---|---|
| 01. | AR 9821/2 | HD -4704 යතුරු පැදි | 01 |
| 02. | එම | WD - 0234 යතුරු පැදි | 01 |
| 03. | එම | HJ - 4834 යතුරු පැදි | 01 |
| 04. | එම | MA - 8162 යතුරු පැදි | 01 |
| 05. | එම | JC - 3060 යතුරු පැදි | 01 (අබලි) |
| 06. | එම | 142 - 4762 යතුරු පැදි | 01 (අබලි) |
| 07. | එම | 144-9128 යතුරු පැදි | 01 (අබලි) |
| 08. | එම | JM - 5917 යතුරු පැදි | 01 |
| 09. | එම | WD - 0831 යතුරු පැදි | 01 |
| 10. | එම | WV - 3564 යතුරු පැදි | 01 (අබලි) |
| 11. | එම | BAH - 6325 යතුරු පැදි | 01 (අබලි) |
| 12. | එම | AAM - 4806 ත්‍රීරෝද රථ | 01 |
| 13. | එම | UQ - 0252 යතුරු පැදි | 01 |
| 14. | එම | BHX - 0725 යතුරු පැදි | 01 |
| 15. | එම | UK - 0843 යතුරු පැදි | 01 |
| 16. | එම | HO - 5015 යතුරු පැදි | 01 (අබලි) |
| 17. | එම | UC - 7544 යතුරු පැදි | 01 (අබලි) |
| 18. | එම | JF - 4980 යතුරු පැදි | 01 |

04-143

## දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - වැල්ලවාය

අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ නඩු භාණ්ඩ හා වාහන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

වැල්ලවාය, දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු වලට අදළ රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් නොපාන ලද පහත සඳහන් නඩු භාණ්ඩ **2022.04.30 වැනි දින පෙ. ව. 10.00 ට** අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙහි වෙන්දේසි කරනු ලබන කිසියම් භාණ්ඩයක් හෝ වාහනයක් සම්බන්ධයෙන් හිමිකම් පාන්නකු වේ නම්, ඒ පිළිබඳව වෙන්දේසිය පවත්වනු ලබන දින පෙ. ව. 10.00 ට පෙර ස්වකීය අයිතිවාසිකම් අධිකරණ රෙජිස්ට්‍රාර්වරයා වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතු ය.

2. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබාගෙන වෙන්දේසිය ආරම්භයට පැය 1 1/2 කට ප්‍රථම වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ සහ වාහන පරීක්ෂා කර බැලිය හැකි ය.

3. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගන්නා අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ සහ වාහන වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතු වේ.

4. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ සහ වාහන එදිනම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

5. සියලුම මිලදී ගැනීම් සඳහා ගෙවීම් ලංකාවේ වලංගු මුදලින් ගෙවිය යුතු අතර, චෙක්පත් හා මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

6. භාණ්ඩ සහ වාහන මිලදී ගැනීමට පැමිණෙන අය ජාතික හැඳුනුම්පත හෝ වෙනත් පිළිගත හැකි හැඳුනුම්පතක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

7. වෙන්දේසිය සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් තිබේනම් වෙන්දේසිය පවත්වනු ලබන අවස්ථාවේ ඉදිරිපත් කළ යුතු අතර, වෙන්දේසියෙන් පසු ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

8. වෙන්දේසියේ දී විකුණනු ලබන වාහන සම්බන්ධයෙන් මෝටර් රථ පරීක්ෂකවරයා විසින් අබලි ලෙස නියම කරන ලද වාහන සඳහා නැවත ගැණුම්කරු නමින් ලියාපදිංචි කිරීමට කිසිදු ලේඛනයක් අධිකරණය විසින් ලබා දෙනු නොලැබේ.

දිසා විනිසුරු හා මහෙස්ත්‍රාත්.

2022 අප්‍රේල් මස 04 වැනි දින,
වැල්ලවාය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**නඩු භාණ්ඩ වෙන්දේසිය - 2022.04.30**

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 01. | 35872 | නැෂනල් වර්ගයේ දෙර දෙක ශීතකරණ 01 |
| 02. | 39660 | උදලු 01 |
| 03. | 39842 | රෙගියුලේටරය සහිත තනි ගෑස් ලිප 12.5kg ලිට්රෝ වර්ගයේ ගෑස් සිලින්ඩර් 01 |
| 04. | 50927 | ලී හැඩ කැපීමට භාවිතා කරන රවුටර් 01 |
| 05. | 37603 | ගැරුම් වට්ටි 01, උදලු 01, ඉල්ලන් කුරු 01 |
| 06. | 40339 | සවල් 02 |
| 07. | 50453 | කුළුගෙඩි 01 |
| 08. | 40702 | අලු පැහැති වයර් අඩි 33, බයින්ඩින් වර්ගයේ කම්බි කැබලි 03, ලොකු කම්බි කැබලි 08, කලු පැහැති වයර් අඩි 243 |
| 09. | 50508 | කැති 01, උදලු 01, බෙහෙත් විදින යන්ත්‍ර 01 |
| 10. | 39870 | යකඩ ෆුට්වැල් 01 සහිත බටය ප්ලාස්ටික් ෆුට්වැල් 01 සහිත බටය භූමිතෙල් වතුර මෝටර් 01 ඩීසල් වතුර මෝටර් 01 |
| 11. | 53337 | කාන්තා පාවහන් යුගලයක් |
| 12. | | රාජසන්තක කරන ලද හිස් වීදුරු බෝතල් තොගයක් |
| 13. | | රාජසන්තක කරන ලද ප්ලාස්ටික් බූලි තොගයක් |
| 14. | | රාජසන්තක කරන ලද බැරල් තොගයක් |
| 15. | | අබලි අත්ට්‍රැක්ටරය |
| 16. | | අබලි අත්ට්‍රැක්ටරය |
| 17. | | අබලි අත්ට්‍රැක්ටරය |
| 18. | | අබලි අත්ට්‍රැක්ටරය |
| 19. | | අබලි අත්ට්‍රැක්ටරය |
| 20. | | අබලි අත්ට්‍රැක්ටරය |
| 21. | | අබලි අත්ට්‍රැක්ටරය |
| 22. | | අබලි අත්ට්‍රැක්ටරය |
| 23. | | අබලි අත්ට්‍රැක්ටරය |
| 24. | | අබලි අත්ට්‍රැක්ටරය |
| 25. | | අබලි අත්ට්‍රැක්ටරය |
| 26. | | අබලි අත්ට්‍රැක්ටරය |
| 27. | | අබලි අත්ට්‍රැක්ටරය |
| 28. | | අබලි අත්ට්‍රැක්ටරය |
| 29. | | අබලි අත්ට්‍රැක්ටරය |
| 30. | | අබලි අත්ට්‍රැක්ටරය |
| 31. | | අබලි අත්ට්‍රැක්ටරය |
| 32. | | අබලි අත්ට්‍රැක්ටරය |
| 33. | | අබලි අත්ට්‍රැක්ටරය |
| 34. | | අබලි අත්ට්‍රැක්ටරය |
| 35. | | අබලි අත්ට්‍රැක්ටරය |
| 36. | | අබලි අත්ට්‍රැක්ටරය |
| 37. | | අබලි අත්ට්‍රැක්ටරය |
| 38. | | අබලි අත්ට්‍රැක්ටරය |
| 39. | | අබලි අත්ට්‍රැක්ටරය |

04-215

# රජයේ නොවන දැන්වීම්

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොළඹ 05, පොල්හේන්ගොඩ පාර, අංක 2/246 හි පදිංචි දුෂ්මන්ත කුමාර පද්මදේව කරන්නාගොඩ (ජා. හැ. අංක 602780589 X) වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාවට මෙසේ ප්‍රකාශ කර සිටිමි. විජිත මීගහවත්ත ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් ලියා සහතික කරන ලද අංක 2149 සහ 2016.05.10 දිනැති විශේෂ ඇටර්නි බලපත්‍රයෙන් පත්කල මාගේ ඇටර්නි බලකාර ශෙරාන් තලින්ද්‍ර සූරියරච්චි (ජා. හැ. අ. 600711482 V) යන අයට ලබා දී තිබූ විශේෂ ඇටර්නි බලපත්‍රය සහ ඇටර්නි බලය 2022.03.25 දින සිට අවලංගු කරන ලද බවයි.

දුෂ්මන්ත කුමාර පද්මදේව කරන්නාගොඩ.

04-114

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොළඹ 13, කොටහේන, කොලේජ් ස්ට්‍රීට්, අංක 90 පදිංචි සච්චිතානන්දම් රතීෂ් කාන්ත් ශ්‍රී ලංකා ජා.හැ.අංක 772050704 V) වන මා විසින් කොළඹ නීතිඥ එස්. ඩබ්ලිව්. කළුගල්ල යන අය විසින් ලියා සහතික කරන ලද ශ්‍රී ලංකා ජනරජයේ කොළඹ 13, කොටහේන, කොලේජ් ස්ට්‍රීට් හි අංක 90 පදිංචි ඉවැන්ජලීන් මහේස්වරි දේවි සච්චිතානන්දම් (ජා. හැ. අංක 195870101689) යන අය වෙත, මාගේ නිර්දිෂ්ඨ කාර්ය හා කටයුතු සඳහා මාගේ සත්‍ය හා නීත්‍යානුකූල ඇටර්නිවරිය ලෙස පත් කෙරෙමින් ප්‍රදානය කළ 2017 සැප්තැම්බර් මස 25 දිනැති අංක 20 දරන විශේෂ ඇටර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කළ බව මෙයින් දනුම් දෙමි. එසේ ම, මෙම දිනයෙන් පසු, ඉහත කී ඉවැන්ජලීන් මහේස්වරි දේවි සච්චිතානන්දම් යන අය විසින් ඉහත ඇටර්නි බලපත්‍රය යටතේ මාගේ නමින් හෝ මා වෙනුවෙන් හෝ කරනු ලබන කිසිදු ක්‍රියාවකට හෝ ගනුදෙනුවකට මගේ වගකීමක් නොමැති බව ද ප්‍රකාශ කරමි.

සච්චිතානන්දම් රතීෂ්කාන්ත්.

04-116

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

2022 ක් වූ මාර්තු මස වස්කඩුව, නුගගොඩ, පනාපිටිය පාරේ, පදිංචි ජා. හැ. අංක 682172762 V හිමි මානන්දුව ආචාරිගේ නිමල් ඉන්ද්‍රසිරි වන මා විසින් කටුවැල්ලේගම, මීගමුව හරහා පදිංචි ජා. හැ. අංක 198070903959 හිමි සේසත්පුර දේවගේ නිසාන්ති යන අය වෙත බලය පවරමින් වර්ෂ 2019 ක් වූ ජනවාරි මස 03 වැනි දින මීගමුව පදිංචි චාන්දනී දයාරත්න ප්‍රසිද්ධ නොතාරිස් මහත්මිය ඉදිරියේ අත්සන් කළ අංක 13386 දරන විශේෂ ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කර ශූන්‍ය කර බල රහිත කර සිටිමි.

මෙතැන් සිට සේසත්පුර දේවගේ නිසාන්ති යන අය විසින් මා වෙනුවෙන් කරනු ලබන කිසිම ක්‍රියාවක් සම්බන්ධයෙන් හෝ ඇතුළත් වනු ලබන කිසිම ගිවිසුමක් සම්බන්ධයෙන් මා වගකියනු නොලබන බව ද මෙයින් දනුම් දෙමි.

එම්. ඒ. නිමල් ඉන්ද්‍රසිරි.

04-133

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

මාකොළ, මාකොළ දකුණ, සපුගස්කන්ද පාර, අංක 10/බී/4 හි පදිංචි හේරත් මුදියන්සේලාගේ චරිත දේවින්ද (ජා. හැ. ප. අංක 753001328 V සහ විදේශ ගමන් බලපත්‍ර අංක N 8390497) වන මම ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඒ. බී. එම්. පෙරේරා විසින් සහතික කරන ලද අංක 423 සහ 2019 ක් වූ දෙසැම්බර් මස 27 වැනි දින දරන විශේෂ ඇටර්නි බලපත්‍රයෙන් කොළඹ 03, 5 වන පටුමග, අංක 96 හි පදිංචි හේරත් මුදියන්සේලාගේ ඔමාලි සමුද්‍රා (ජා. හැ. ප. අංක 967173010 V සහ විදේශ ගමන් බලපත්‍ර අංක N 7783070) හට දෙන ලද ඇටර්නි බලය 2022.03.22 වැනි දින සිට අවලංගු කරන ලද බවත්, ඔහු විසින් මින් ඉදිරියට කරනු ලබන කිසිදු ක්‍රියාවකට මා වග නොකියන බව ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සියලු දෙනා වෙත මෙයින් දන්වා සිටිමි.

හේරත් මුදියන්සේලාගේ චරිත දේවින්ද.

04-134

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ගම්පහ, නන්දන මාවත, අංක 01/A හි පදිංචි ජයකොඩි ආරච්චිලාගේ ජයන්ත ඥානසිරි ජයකොඩි (ජා. හැ. අංක 763322025 V) වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාවට මෙසේ ප්‍රකාශ කර සිටිමි. කාරියවසම් ගමරාලලාගේ දයානි ප්‍රියංගිකා කාරියවසම් ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් ලියා සහතික කරන ලද අංක 487 සහ 2017.12.15 දිනැති විශේෂ ඇටර්නි බලපත්‍රයෙන් පත්කළ මාගේ ඇටර්නි බලකාර වේරගොඩ විදානෙලාගේ ප්‍රමිලා ජයකොඩි (ජා. හැ. අංක 816020239 V) යන අයට ලබා දි තිබූ විශේෂ ඇටර්නි බලපත්‍රය සහ ඇටර්නි බලය 2022.03.23 දින සිට අවලංගු කරන ලද බවයි.

ජයකොඩි ආරච්චිලාගේ ජයන්ත ඥානසිරි ජයකොඩි.

04-150

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ඩච් රෝඩ්, සන්කුවේලි උතුර, මනිපේ, ශ්‍රී ලංකා සහ දැනට Eschborner Strasse 41A, 61449 Steinbach, Germany හි පදිංචිව සිටින හඩ්සන් සහ පුෂ්පමලර් හඩ්සන් වන අප විසින් ජර්මනියෙහි ප්‍රසිද්ධ නොතාරිස් කරින් රොන්ෂ් (Karin Ronsch) විසින් 2018 ජනවාරි මස 11 වැනි දින ලියා සහතික කරන ලද විශේෂ ඇටර්නි බලපත්‍රය මගින් අංක 39, සෝමසුන්දරම් මාවත, යාපනයෙහි පදිංචි තිරුචෙල්වම් මයිකල් (ජාතික හැඳුනුම්පත් අංක 500833017 V) යන අය වෙත පවරන ලද නීත්‍යානුකූල විශේෂ ඇටර්නි බලය 2022.03.25 වැනි දින සිට අවලංගු, බලරහිත හා ශූන්‍ය වන බවටත් එකී බලපත්‍රය ප්‍රකාරව කිසිදු ක්‍රියාවකට, ඔප්පුවකට හෝ වෙනත් යම් වගකීමකට මින්පසුව යටත් නොවන බවටත් ශ්‍රී ලංකාවාසී සියලු දෙනාගේ ම දැනගැනීම පිණිස මෙයින් දන්වනු ලැබේ.

හඩ්සන් සහ පුෂ්පමලර් හඩ්සන්.

04-158

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

අංක 30/20, මැදගොඩ පාර, රන්දොඹේ, අම්බලන්ගොඩ යන ලිපිනයේ, පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 842743281 V (නව හැඳුනුම්පත් අංක 198427403281) හිමි අමිඳු සුරංජ මෙන්ඩිස් විජේසිංහ සමරසේකර වන මම, බෙන්තොට, මිරිස්වත්ත, කනහෙන්තොට යන ලිපිනයේ පදිංචි නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් සුදත් පයාගලගේ විසින් ලියා සහතික කළ අංක 442 හා 2014 මැයි 22 දින දරන ඇටර්නි බලපත්‍රය මගින් අංක 30/20, මැදගොඩ පාර, රන්දොඹේ, අම්බලන්ගොඩ යන ලිපිනයේ පදිංචි ප්‍රදීප මෙන්ඩිස් විජේසිංහ සමරසේකර (612914216 V) මහතා වෙත පවරන ලද ඇටර්නි බලය වර්ෂ 2022 මාර්තු මස 19 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මෙයින් අවලංගු කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි මහජනතාවටත් දන්වා සිටිමි.

2022 මාර්තු 19 දිනෙන් පසුව ඉහත කී අංක 442 හා 2014 මැයි 22 දින දරන ඇටර්නි බලපත්‍රය මගින් කරනු ලබන කිසිදු ගනුදෙනුවකට මාගේ වගකීමක් හෝ සම්බන්ධතාවයක් නොමැත.

අමිඳු සුරංජ මෙන්ඩිස් විජේසිංහ සමරසේකර.

04-159

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

පොල්ගහවෙල, ආරගොඩ, දෙනගමුවත්ත හි පදිංචි වික්‍රමගේ නම්‍යා ප්‍රියදර්ශණී ජානකදේවි (ජාතික හැඳුනුම්පත් අංක 675251533 V) වන මා විසින් මාගේ ඇටර්නි බලකරු ලෙස පොල්ගහවෙල, ආරගොඩ, දෙනගමුව වත්ත අංක 343 ඒ හි පදිංචි වික්‍රමගේ ලක්ෂ්මන් විජිත බණ්ඩාර (ජාතික හැඳුනම්පත් අංක 593341062 V) යන අය පත් කරමින් කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඒ. ඩී. පී. කුරුප්පු විසින් ලියා සහතික කරන ලද රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවේ වයඹ උතුරු මැද කලාප කාර්යාලයේ ඇටර්නි බලපත්‍ර පොතේ 44 කාණ්ඩයේ 2824 පත්‍රිකාවේ 1696 දින පොත් අංකය යටතේ ලියාපදිංචි කළ අංක 2801 සහ 2011.04.25 වැනි දිනත් දරන ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කරන බවත් මින් ඉදිරියට එකී වික්‍රමගේ ලක්ෂ්මන් විජිත බණ්ඩාර යන අය විසින් එකී විශේෂ ඇටර්නි බලපත්‍රය යටතේ මාගේ නාමයෙන් හෝ මා වෙනුවෙන් හෝ කරනු ලබන්නා වූ කිසිදු ගණුදෙනුවකට හෝ ක්‍රියාවකට මා වග නොකියන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

වික්‍රමගේ නම්‍යා ප්‍රියදර්ශණී ජානකදේවි.

2022 අප්‍රේල් මස 04 වැනි දින, කුරුණෑගල දී ය.

04-181

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතෙහි 5 වන වගන්තිය අනුව පහත සඳහන් සමාගම සංස්ථාගත කරනු ලැබේ.

සමාගමේ නම : ක්වන්ටම් ක්වාර්ටස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ පී වී : 105865
දිනය : 2015.05.26
ලිපිනය : අංක 105/1, මාදුපිටිය පාර, මහවිල, පානදුර

S. C. Ranganath A. Fernando
Company Secretary.

04-127

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතෙහි 5 වන වගන්තිය අනුව පහත සඳහන් සමාගම සංස්ථාගත කරනු ලැබේ.

සමාගමේ නම : ගල්පාත ක්වොරි ප්‍රොඩක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ පී වී : 00227924
දිනය : 2020.09.23
ලිපිනය : අංක 105/1, මාදුපිටිය පාර, මහවිල, පානදුර.

S. C. Ranganath A. Fernando
Company Secretary.

04-128

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

වැළඩ, පරගහදෙනිය, අංක 279 හි පදිංචි මුහම්මදු මව්රූෆ් මුහම්මදු ජෙස්මි වන මා විසින් වැළඩ, පරගහදෙනිය අංක 279 හි පදිංචි මුහම්මදු මව්රූෆ් මොහොමඩ් ජෙස්වාන් යන අයට ලබා දී ඇති ප්‍රසිද්ධ නොතාරිස් ෆාතිමා එන්. අන්සාර් විසින් ලියා සහතික කල අංක 2398 සහ 2012.04.11 දිනැති ඇටර්නි බලපත්‍රය අද දින සිට අවලංගු කර බල රහිත කර ඇති බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

මුහම්මදු මව්රූෆ් මුහම්මදු ජෙස්මි.

04-130

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

මෙයින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් දැනුම් දෙන වග නම්, 2012.10.19 ඉන්දියාවේ, කේරල, කසාරගෝඩ්, නොතාරිස් සී. රවිකුමරන් නායර් මහතා විසින් සහතික කරන ලද වෙළුම 21 පත්‍රිරූ 28 අනුක්‍රමානුකූල අංක 05 සහ

2013.01.04 වැනි දින රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, නැගෙනහිර කලාපය, මඩකලපුවේදී ලියාපදිංචි කරන ලද ඇටර්නි බලපත්‍රය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තින්දවූර් 12, වන්නියාර් පාර, අංක 206 ඒ හි පදිංචි අබ්දුල් ගෆූර් මුහම්මඩ් සුහුඩ් යන අයට ඉන්දියාවේ කේරල ප්‍රාන්තයේ කසාරගෝඩ් දූ. පැ. බේක්කල 671318, කොඩ්ඩිකුලම්, කේ. එන්. ලිපිනයෙහි පදිංචි කේ. එන්. මුහම්මඩ් ජිෆ්රි වන මා විසින් ලබාදුන් එකී ඇටර්නි බලපත්‍රය 2022.01.29 වැනි දින සිට අවලංගු කර අහෝසි කරන ලදී. මේ දින සිට ඇටර්නි බලකරු විසින් ඉහත සඳහන් ඇටර්නි බලපත්‍රය යටතේ කරන ලද කිසියම් ක්‍රියාවලට සහ පියවරවලට මා වගකියනු නොලැබේ.

කේ. එන්. මුහම්මඩ් ජිෆ්රි.

04-140

---

## ඇටර්නි බලපත්‍රය අහෝසි කිරීම

යූ. ඩබ්ලිව්. ඊ. බේකර් ගුවන් ගමන් බලපත්‍ර අංකය C4KJ 47986 හිමි අංක 48 "The Nest" නිවාසිපුර, කොටුගොඩ. ජාඇල (කලින් අංක 178, බසියාවත්ත, තලාහේන, මීගමුව) පදිංචි මා විසින් අංක 208/2 ලක්ෂ්මන් මාවත, සමුද්‍ර වීදිය, මීගමුව යන ස්ථානයේ පදිංචි වර්ණකුලසූරිය මනෝරි දිල්මිනි වෙත ලබාදෙන ලද 2003 ජුනි මස 09 වැනි දින ඩබ්ලිව්. ඈෆ්. ඊ. ප්‍රනාන්දු ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද අංක 2997 දරන ඇටර්නි බලපත්‍රය මා විසින් ක්ෂණිකව ක්‍රියාත්මක වන පරිදි අහෝසිකර අවලංගුකර, ප්‍රත්‍යාදිෂ්ඨකර ඇති බව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

U. W. E. Becker.

2022 මාර්තු මස 23 වැනි දින,
ජා-ඇල.

04-141

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කර ඇති බවට කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : පෙන්ටෙක් ඉංජිනියර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලය : අංක 07, ෆර්නිලංකා පාර, වල්පොල, රුග්ගහවිල
සංස්ථාගත කළ දිනය : 2021.03.14 වැනි දින,
ලියාපදිංචි අංකය : පීවී 236504

සමාගම් ලේකම්.

04-142

## සාමාන්‍ය ඇටර්නි බලපත්‍රය (විදේශ) අවලංගු කිරීම

''විමුක්ති'', පට්ටියගම, මාදම්පේ හි පදිංචි ජයවර්ධන ගෝමරගේ දෝන ක්‍රිස්ටින් මනෝරි යන අය ඇටර්නි බලකාරිය ලෙස පත් කරමින් වර්ෂ 2016.07.08 වැනි දින එච්. යූ. ජයසූරිය සාමදාන විනිසුරු විසින් ලියා සහතික කරන ලද සාමාන්‍ය විදේශ ඇටර්නි බලපත්‍රය ඇටර්නි අධිපති වන ''විමුක්ති'' පට්ටියගම, මාදම්පේ හි පදිංචි සන්දනම් සදාන් රොෂාන්ත වන මා විසින් මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කර අවලංගු කළ බව මෙයින් දැනුම් දෙමි.

සන්දනම් සදාන් රොෂාන්ත.

2022 මාර්තු මස 28 වැනි දින.

04-144

---

## විශේෂ ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

අංක 212/3, ලූවිස් පෙදෙස, කුඩාපාඩුව, මීගමුව හි පදිංචි මිහිඳුකුලසූරිය රවීන්ද්‍ර රාජ් යන අය ඇටර්නි බලකරු ලෙස පත් කරමින් වර්ෂ 2011.04.14 වැනි දින අනූෂා පත්මපෙරුම ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් ලියා සහතික කරන ලද අංක 2075 දරන විශේෂ ඇටර්නි බලපත්‍රය ඇටර්නි අධිපති වන අංක 91, සෙල්බි පාර, මීගමුව හි පදිංචි මිහිඳුකුලසූරිය සෙබස්තියන් ප්‍රනාන්දු වන මා විසින් මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කර අවලංගු කළ බව මා විසින් මෙයින් දැනුම් දෙමි.

මිහිඳුකුලසූරිය සෙබස්තියන් ප්‍රනාන්දු.

2022 මාර්තු මස 29 වැනි දින.

04-145

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීමේ දැන්වීමයි

ශ්‍රී ලංකා ජනරජයේ නුගේගොඩ, උඩහමුල්ල අංක 49/31 හි පදිංචි චරිත නුවන් කපුරුබණ්ඩාර වන මා විසින් එම ජනරජයේ නුගේගොඩ - උඩහමුල්ල අංක 49/31 හිමි පදිංචි දිසානායකගේ මධුකා රෂන්ති (ජාතික හැඳුනුම්පත් අංක 867740678 V) වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. ඩී. ඇඹුල්දෙනිය ඉදිරියේ දී වර්ෂ 2012 මැයි මස 01 වැනි දින දී සහතික කළ අංක 2164 දරන ඇටර්නි බලපත්‍රය වර්ෂ 2022 ක් වූ ජනවාරි මස 07 වැනි දින සිට බලරහිත කොට අවලංගු කළ බව මෙයින් ප්‍රකාශ කරන අතර මින් ඉදිරියට එකී ඇටර්නි බලකරුව සිටි දිසානායකගේ මධුක රෂන්ති විසින් මාගේ නමින් හෝ මා වෙනුවෙන් සිදු කරනු ලබන කිසියම් ක්‍රියාවකට, බලයකට, ඔප්පුවකට හෝ කිසිම කරුණකට එකී අය වෙනුවෙන් වග නොකියන බව ද ප්‍රකාශ කර සිටිමි.

චරිත නුවන් කපුරුබණ්ඩාර.

04-174

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය යොමු අංක - 75441600 සහ 77841716.

කුලියාපිටිය, හෙට්ටිපොල පාරේ, හිදියාමුල්ල හන්දියේ පිහිටි පිලිප්ලී ග්ලෝබල් පුද්ගලික සමාගමට අයත් උකස් කරන ලද දේපල විකිණීම.
වත්තල, මාබෝල, මුතුරාජ මාවත (හැඳල පටුමග) අංක 58/7 ලිපිනයෙහි පදිංචි රතුගමගේ පිලිප් ජයසිරි ප්‍රනාන්දු මහතා සහ ෂැංගියන් ලී මිය අධ්‍යක්ෂවරු වෙති.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2019 නොවැම්බර් මස 08 දිනැති අංක 2149 දරන ගැසට් පත්‍රයේ හා 2019.10.28 වැනි දින ''ඩේලිනිව්ස්'', 'තිනකරන්'' හා ''දිනමිණ'' යන පුවත්පත් වල පළකරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල සහ පරිශ්‍ර පිහිටි ස්ථානයේ දී ම

**2022.05.11 වැනි දින පෙ. ව. 11.00** ට කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

#### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පල හත්පත්තුවේ, යටිකහ කෝරළේ (උතුරු), පඬුවස්නුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පඬුවස්නුවර ප්‍රාදේශීය සභා සීමාවේ අංක 1405 හිදියාමුල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ හිදියාමුල්ලෙහි ග්‍රාමයෙහි පිහිටි කෝන්ගහමුල පිල්ලෑව සහ දලුපොතේහේන දැන් වත්ත මීගහමුලවත්ත, අඹගහමුලවත්ත සහ ලෝලුගහමුලවත්ත නමැති ඉඩමට එහි ඇති ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ සියලු දේ ඇතුළත්ව බලයලත් මිනින්දෝරු එච්. ඒ. එම්. සී. බංඩාර විසින් සාදන ලද 2011.12.06 දිනැති අංක 5066 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 01, උතුරට : බලයලත් මිනින්දෝරු H. A. M. C බංඩාර විසින් සාදන ලද 1994.07.24 දිනැති අංක 1065 දරන පිඹුරෙහි ලොට් 01 හි ඉතිරි කොටස දැන් W. M. T. M. L. ප්‍රනාන්දු උරුමකම් කියන ඉඩම සහ දැනට R. D. තිලකරත්න උරුමකම් කියන බලයලත් මිනින්දෝරු W. A. සිරිසේන විසින් සාදන ලද 2006.08.22 දිනැති අංක 543 දරන පිඹුරෙහි ලොට් 02 ද, නැගෙනහිරට : දැනට W. M. T. M. L. ප්‍රනාන්දු උරුමකම් කියන අංක 1065 දරන එකී පිඹුරෙහි ලොට් 01 හි ඉතිරි කොටස, දැනට R. D. තිලකරත්න උරුමකම් කියන අංක 543 දරන පිඹුරෙහි ලොට් 2, පාර (මහා මාර්ගය) සහ එකී අංක 543 දරන පිඹුරෙහි ලොට් 5 සහ දැනට G. M. සේනාරත්න උරුමකම් කියන බලයලත් මිනින්දෝරු Y. M. A. යාපා විසින් සාදන ලද 1993.04.05 දිනැති අංක 3547 දරන පිඹුරෙහි ලොට් 03 හි ඉතිරි කොටස ද, දකුණට : එකී අංක 543 දරන පිඹුරෙහි ලොට් 5 සහ දැනට ජී. එම්. සේනාරත්න උරුමකම් කියන එකී අංක 3547 දරන පිඹුරෙහි ලොට් 03 හි ඉතිරි කොටස ද, ජී. බී. රත්නායක සහ වෙනත් අය උරුමකම් කියන කුඹුර ද, බස්නාහිරට : දැනට K. A. R. ජයසුමන උරුමකම් කියන එකී අංක 3547 දරන පිඹුරෙහි ලොට් 2 සහ 4 ද මායිම්ව එකී අංක 5066 දරන පිඹුරට අනුව අක්කර එකයි රූඩ් දෙකයි පර්චස් දාහතයි දශම හයක (අ. 01, රූ, 02. පර් 17.6) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ Q 29/10 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ආර්. එම්. එස්. රාජපක්ෂ,
ප්‍රධාන කළමනාකරු.

ලංකා බැංකුව,
පුද්ගලික ශාඛාව.

04-98

---

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ඒ. ඩී. අයි. විජේතුංග.
ගිණුම් අංක : 1114 5396 0703.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2020.12.16 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා

සම්මුතියට අනුව රුපියල් හැට පන් ලක්ෂ හතළිස් අට දහස් තුන්සිය විසි නමයයි ශත පනස් හයක (රු. 6,548,329.56) මුදල ද, 2020 නොවැම්බර් මස 11 වැනි දින සිට අංක 1597 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හැට දෙලක්ෂ හැත්තෑ නම දහස් හාරසිය දාහතයි ශත හැත්තෑ නමයක (රු. 6,279,417.79) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දොළහයි දශම පහක් (12.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වේතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2021.04.16 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2021.04.06 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි

**2022.05.04 වැනි දින පෙ. ව. 10.30 ට** පිහිටි ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

